(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 4. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

## 2020 ජනවාරි 09 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට

# පැමිණි මන්ත්‍රීන් :

**ගරු කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා,** අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා,** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,** වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු එස්. බී. දිසානායක මහතා,** ඉඩම් හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු විමලවීර දිසානායක මහතා,** වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** ජාත්‍යන්තර සහයෝගීතා රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තාරක බාලසූරිය මහතා,** සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජානක වක්කුඹුර මහතා,** අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තිලංග සුමතිපාල මහතා,** තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු තලතා අතුකෝරල මහත්මිය**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු වජිර අබේවර්ධන මහතා**

**ගරු අශෝක් අබේසිංහ මහතා**

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**

**ගරු ජෝන් අමරතුංග මහතා**

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

**ගරු ජේ. සී. අලවතුවල මහතා**

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

**ගරු රවී කරුණානායක මහතා**

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

**ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

**ගරු පියසේන ගමගේ මහතා**

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**

**ගරු සිසිර ජයකොඩි මහතා**

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු කරුණාරත්න පරණවිතාන මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු ධුලිප් විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු සුජීව සේනසිංහ මහතා**

**ගරු වසන්ත සේනානායක මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තුවේ 140 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව, අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය තුළදී සභාපති නාමාවලියට ඇතුළත්ව සේවය කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සිව්වැනි සභාවාරය තුළදීත් සේවය කිරීමට මා විසින් නම් කරන ලද අතරම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු ජානක වක්කුඹුර සහ ගරු තාරක බාලසූරිය යන මහත්වරුන් රාජ්‍ය අමාත්‍යධුරවලට පත්වී ඇති බැවින්, එම මන්ත්‍රීවරයන් දෙදෙනා වෙනුවට අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය තුළදී සභාපති නාමාවලියට ඇතුළත්ව සේවය කිරීම පිණිස ගරු තේනුක විදානගමගේ සහ ගරු මලිත් ජයතිලක යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනා මා විසින් නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XIV කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVII සහ XXVIII කොටස්;

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XI කොටස;

(iv) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVI, XVII, XVIII, XIX, XX හා XXI කොටස්, තෙවැනි කාණ්ඩයේ VII, VIII, IX හා X කොටස් සහ නවවැනි කාණ්ඩයේ VI, VII, VIII හා IX කොටස්; සහ

(v) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ XV කොටස

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතු යැයිද, නියෝග කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2020 ජනවාරි 21 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**5. ශෝක ප්‍රකාශ යෝජනා :** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා විසින්, අභාවප්‍රාප්ත හිටපු අග්‍රාමාත්‍ය සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දි. මු. ජයරත්න මහතා, පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

හිටපු අග්‍රාමාත්‍ය සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දි. මු. ජයරත්න මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් ඊට එක් වූ කථානායකවරයා මෙම යෝජනාවට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත ශෝකයට පත් පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරන ලදී.

**6. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 4.37 ට, අද දින සභා සම්මතිය අනුව, 2020 ජනවාරි 21 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.